මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2026.02.25 |

# ඉඩම් තක්සේරු දර්ශකය[1] - 2025 වසරේ දෙවන භාගය

කොළඹ දිස්ත්‍රික්කය සඳහා සම්පාදනය කරන ලද ඉඩම් තක්සේරු දර්ශකය, ඉහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින් 2024 වසරේ දෙවන භාගයට සාපේක්ෂව 2025 වසරේ දෙවන භාගයේ දී සියයට 10.6කින් වර්ධනය විය. මෙම වර්ධනය, ඉඩම් තක්සේරු දර්ශකයෙහි අනු දර්ශක වන නේවාසික, වාණිජ හා කාර්මික යන අනු දර්ශක තුනෙහිම පිළිබිඹු වූ අතර, ඒවා පිළිවෙළින් සියයට 12.4ක, 11.3ක සහ 8.0ක වාර්ෂික ඉහළයෑම් වාර්තා කළේය. මේ අතර, 2025 වසරේ පළමු භාගයේ වාර්තා වූ අගයන්ට සාපේක්ෂව 2025 වසරේ දෙවන භාගයේ දී, ඉඩම් තක්සේරු දර්ශකය සහ එහි අනු දර්ශක අර්ධ වාර්ෂික පදනම අනුව මධ්‍යස්ථ වේගයකින් වර්ධනය විය. මෙහිදී, වාණිජ සහ නේවාසික අනු දර්ශක ඉහළ වර්ධන වේගයන් පෙන්නුම් කළේය.

### ඉඩම් තක්සේරු දර්ශකයෙහි විචලනය (2017 පළමු කාර්තුව = 100)




### සුවිශේෂී කාර්යසාධනයන්

| ඉඩම් තක්සේරු දර්ශක අගය | වාර්ෂික වැඩිවීම |
|---|---|
| 261.9 | 10.6 % |
| | අර්ධ වාර්ෂික[2] වැඩිවීම |
| | 2.1 % |

### ඉඩම් තක්සේරු දර්ශකයෙහි වාර්ෂික වර්ධනය




### ඉඩම් තක්සේරු දර්ශකයේ භූ ගෝලීය ආවරණය : කොළඹ දිස්ත්‍රික්කය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ඉඩම් තක්සේරු දර්ශකය සහ එහි වර්ධනය[3]

| කොළඹ දිස්ත්‍රික්කය සඳහා ඉඩම් තක්සේරු දර්ශකය (පදනම් වර්ෂය: 2017 වසරේ පළමු භාගය) | දර්ශක අගය | | | | | | වාර්ෂික වර්ධනය (සියයට) | | | | අර්ධ වාර්ෂික[2] වර්ධනය (සියයට) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 පළමු භාගය | 2023 දෙවන භාගය | 2024 පළමු භාගය | 2024 දෙවන භාගය | 2025 පළමු භාගය | 2025 දෙවන භාගය | 2024 පළමු භාගය | 2024 දෙවන භාගය | 2025 පළමු භාගය | 2025 දෙවන භාගය | 2024 පළමු භාගය | 2024 දෙවන භාගය | 2025 පළමු භාගය | 2025 දෙවන භාගය |
| නේවාසික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 215.0 | 221.0 | 233.3 | 242.9 | 266.9 | 273.1 | 8.5 | 9.9 | 14.4 | 12.4 | 5.6 | 4.1 | 9.9 | 2.3 |
| වාණිජ ඉඩම් තක්සේරු අනු දර්ශකය | 210.3 | 214.0 | 228.1 | 234.1 | 254.3 | 260.6 | 8.5 | 9.4 | 11.5 | 11.3 | 6.6 | 2.7 | 8.6 | 2.5 |
| කාර්මික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 220.7 | 224.5 | 228.9 | 233.2 | 248.0 | 251.9 | 3.7 | 3.9 | 8.4 | 8.0 | 2.0 | 1.9 | 6.3 | 1.6 |
| **ඉඩම් තක්සේරු දර්ශකය** | **215.3** | **219.8** | **230.1** | **236.8** | **256.4** | **261.9** | **6.9** | **7.7** | **11.4** | **10.6** | **4.7** | **2.9** | **8.3** | **2.1** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[1] ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද ඉඩම් මිල දර්ශකය 2019 දෙවන කාර්තුවේ සිට ඉඩම් තක්සේරු දර්ශකය ලෙස ප්‍රතිනාමකරණය කර ඇත.

[2] පසුගිය අර්ධ වර්ෂයට සාපේක්ෂව මෙම අර්ධ වර්ෂයේ ඉඩම් තක්සේරු දර්ශකයේ ප්‍රතිශත වෙනස

[3] රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු ක්‍රමවේදය සංශෝධනය කොට ලබා දෙන ලද නව ඇස්තමේන්තු මත පදනම්ව ඉඩම් තක්සේරු දර්ශකයේ (2017 පළමු භාගය=100) සම්පූර්ණ දත්ත මාලාව 2022 ජුනි මස සංශෝධනය කර ඇත. එම සංශෝධිත දත්ත මාලාව ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත පුස්තකාලය මඟින් බාගත කළ හැක (https://www.cbsl.lk/eresearch/).

## තාක්ෂණික සටහන:

### දත්ත මූලය

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අර්ධ වාර්ෂිකව එක්රැස් කරගනු ලබන හිස් ඉඩම් පර්චසයක් සඳහා වන මිල ගණන් මේ සඳහා භාවිතා කෙරේ.

### ආවරණය සහ කාල පරාසය

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් ආවරණය වන පරිදි 1998 සිට 2008 දක්වා වාර්ෂිකව ද 2009 සිට 2017 දක්වා අර්ධ වාර්ෂිකව ද ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරන ලදී. ඉන්පසු 2017 වසරේ සිට කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ම ඇතුලත් වන පරිදි මෙම දර්ශකයේ භූගෝලීය ආවරණය පුළුල් කර, පදනම් වර්ෂය 2017 පළමු භාගය ලෙස සංශෝධනය කරන ලදී. මෙම ඉඩම් මිල දර්ශකය 2020 වසරේ සිට ඉඩම් තක්සේරු දර්ශකය ලෙස ප්‍රතිනාමකරණය කරන ලද අතර එය අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරේ.

### ක්‍රමවේදය

ඉඩම් භාවිතය සම්බන්ධයෙන් පවත්නා විවිධත්වය සහ සමජාතීත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාව යන කරුණු සැලකිල්ලට ගනිමින්, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඒ ඒ ප්‍රදේශයේ එක් එක් කාණ්ඩයට අයත් ඉඩම් පර්චසයක සාමාන්‍ය මිල උපයෝගී කර ගනිමින් නේවාසික, වාණිජ හා කාර්මික ඉඩම් කාණ්ඩ සඳහා අනු දර්ශක තුනක් ගණනය කරනු ලැබේ. එම අනු දර්ශක තුනෙහි සාමාන්‍යය ඇසුරෙන් ඉඩම් තක්සේරු දර්ශකය ගණනය කරනු ලැබේ.